ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 2026.05.04 |

පැමිණිලිකාර පාර්ශවය : ඒ.චරිත් අසංක මයා,
22/2, ගහබඩ පාර වැවල, පිළියන්දල
(වෙනුවෙන් එක්සත් මානව හිමිකම් සංවිධානය)

වින්දිත පාර්ශවය : ක්‍රිෂ්ටිනා ශලෝම් දියණිය

වගඋත්තරකාර පාර්ශවය :
1. කේ.විජේරාණි මහත්මිය,
   අම්/ පානම මධ්‍ය මහා විද්‍යාලය, අම්පාර
2. එච්. අශෝකා නන්දනී මහත්මිය,
   විදුහල්පති, අම්/ පානම මධ්‍ය මහා විද්‍යාලය, අම්පාර

පැමිණිලි අංකය : **HRC/AM/115/23/ B 1PL සහ HRC/HO/4506/23**

**පැමිණිලි පාර්ශවයේ කරුණු දැක්වීම**

තම දියණිය වන ඒ. ක්‍රිස්ටීනා ශලෝම් දියණිය අම්/ පානම මධ්‍ය මහා විද්‍යාලයේ 1 බී ශ්‍රේණියේ අධ්‍යාපන කටයුතු කරන ලැබු බවත් එහි පන්තිභාර ගුරුතුමිය වන කිරුබරාජා විජයරාණි ගුරුමහත්මියගේ කුරිරු පහර දීමක් හේතුවෙන් 2023.05.10 වන දින එක් කණකට බරපතල තුවාල වී කණ් බෙරය සිදුරු වී කණ් බිත්තිය පුපුරා රුධිරය ගැලීමක් සිදුවී ඇති අතර නාසයේ අභ්‍යන්තරයේ පුපුරා එයින්ද පිටතට රුධිරය ගලා ඇවිත් ඇති බවත් 2023.05.11 වන දින සිට පානම, පොතුවිල් සහ අම්පාර යන රෝහල් තුනෙහි ප්‍රතිකාර ලබා ගන්නා ලද බවත් මෙකී සියලු කාරණා වලින් තම දියණියට අසාධාරණයක් සිදුවී ඇති අතර පොලිසියද, රෝහලද, පාසලද කිරුබරාජ විජයරාණි ගුරුතුමියට සහය ලබා දී ඇති හෙයින් දියණියගේ මානව හිමිකම් උල්ලංඝනය වී ඇතිබවත් සාධාරණයක් බලාපොරොත්තුවෙන් දියණියගේ පියා විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ අම්පාර ප්‍රාදේශීය කාර්යාලයට 2023.06.12 දිනැතිව මෙම පැමිණිල්ල ගොනු කර ඇත.

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ 04. / இல. 14, ஆர். ஏ. த. மெல் மாவத்தை, கொழும்பு 04. / No. 14, R. A. De Mel Mawatha, Colombo 04.
සභාපති / தவிசாளர் / Chairman: 011 - 250 5451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 250 5541/74
ඊමේල් / மின்னஞ்சல் / E-mail: sechrcsl@gmail.com
දුරකථනය / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011 - 250 5521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

ඒ අනුව උක්ත පැමිණිලි ගත සිදුවීමට අදාලව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ අම්පාර ප්‍රාදේශීය කාර්යාලය විසින් 2023.06.27 දින වගඋත්තරකාර පාර්ශවය වන කේ. විජයරාණි මහත්මියගෙන් ප්‍රකාශ සටහන් කර ඇති අතර පානම පොලිස් ස්ථානය විසින් උධෘත සහිත වාර්තාවක් 2023.10.12 දිනැතිව ප්‍රාදේශීය කාර්යාලය වෙත යොමු කර ඇත. සිදුවීමට අදාලව වින්දිත දියණියගේ වෛද්‍ය වාර්තා කැඳවීම සඳහා අදාල දියණිය රෝහල් ගත කළ දිනයන් හා රෝග විනිශ්චිත කාඩ්පත් අම්පාර ප්‍රාදේශීය කාර්යාලය වෙත යොමු කරන ලෙසට පැමිණිලි පාර්ශවය දැනුවත් කල ද එකී ලේඛන නොලැබීම මත 2023.09.25 සහ 2023.10.04 වන දින පැමිණිලි පාර්ශවයේ දුරකථන අංකයට දුරකථන ඇමතුමක් ලබාදී ඇති අතර එහිදී මෙම සිදුවීමට අදාලව කොළඹ ප්‍රධාන කාර්යාලයේ පැමිණිල්ලක් ගොනු කර ඇති බවත් එම පැමිණිල්ලේ සියලු තොරතුරු අමුණා ඇති බවත් පැමිණිල්ලේ විමර්ශන කොළඹ කාර්යාලය හරහා සිදුකිරීම අවශ්‍ය බව දන්වා සිටීම හේතුවෙන් HRC/AM/115/23/ B 1PL ගොනු 2023.11.14 දිනැතිව ප්‍රධාන කාර්යාලයට යොමු කර ඇත.

තවද, පැමිණිලි පාර්ශවය වෙනුවෙන් එක්සත් මානව හිමිකම් සංවිධානය විසින්ද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයට 2023.09.20 දිනැතිව ගොනු කරන ලද පැමිණිල්ල HRC/HO/4506/23 දරණ අංකය යටතේ ලියාපදිංචි කර ඇත. පැමිණිල්ල සම්බන්ධයෙන් 2024.11.26 දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා ප්‍රධාන කාර්යාලයේදී පැවැති පරීක්ෂණයට සහභාගි වෙමින් එක්සත් මානව හිමිකම් සංවිධානයේ අධ්‍යක්ෂ ප්‍රනිතා වර්ණකුලසූරිය මහත්මිය ප්‍රකාශ කර සිටියේ, පරීක්ෂණය සඳහා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් විදුහල්පති කැඳවූවද ඇය පැමිණ නොමැති බවත් විදුහල්පතිවරයා විසින් චක්‍රලේඛයට පටහැනිව 1, 2 වසරවල දරුවන්ගේ ගුරුවරුන් මාරු කර ඇති බවත් එසේම මෙම පහරදීම හේතුවෙන් මේ වන විට රජයේ රෝහල් 5ක හෝ 6ක දරුවා ප්‍රතිකාර ලබා ඇති බවත් එසේම මේ වන විට දරුවා සහ දරුවාගේ මව මානසික ආබාධ සම්බන්ධයෙන් ප්‍රතිකාර ලබමින් සිටින බවත් එසේම පාසල තුල විනය කටයුතු සම්පූර්ණයෙන්ම චක්‍රලේඛයට අනුව උල්ලංඝනය කර ඇති බවත් 2023.05.07 සිට පරීක්ෂණය පවත්වන දින දක්වා දරුවාට පාසලක් නොමැති බවත් මේ සිද්ධිය සම්බන්ධයෙන් නඩු අංක B/9667/23 යටතේ අධිකරණ කරුණු වාර්තා කර ඇත්තේ 314, 316, 308(ආ) කාරත්වය යටතේ පමණක් බවත් එසේම ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XL පරිච්ඡේදයේ 27:10 වගන්තිය යටතේ වැඩ තහනම් කිරීමක් සිදුව නොමැති බවත් ප්‍රකාශ කර ඇත.

<u>වින්දිත දැරියගේ මවගේ ප්‍රකාශය</u>

පැමිණිල්ල සම්බන්ධයෙන් ක්‍රිෂ්ණා ශලෝමී දියණියගේ මව වන ඉන්දිකා කුමාරි ප්‍රකාශ කර සිටින්නේ, 2023.05.10 වන දින තම දියණිය 1.30 වන විට සුපුරුදු පරිදි පාසලේ සිට නිවසට පැමිණෙන බවත්, දියණිය මුඛ ආවරණයක් පැළඳ පැමිණි බවත් ඉන්පසු දියණිය තමාට නාන

කාමරයට නොඑන ලෙස පැවසූ බැවින් තමා කෑම මේසයේ කෑම තබා තමා හට යමක් මැසීමට තිබූ බැවින් එය සිදු කරන ලද බවයි. ඉන්පසු නාන කාමරයේ ශබ්දයක් නොතිබූ බැවින් තමා දියණිය කොහෙද යන්න බැලීමේදී ඇය කෑම කා සෝදා සෙටියේ නිදාගෙන සිටි බැවින් තමා එතනට ඇවිත් Are you ok baby කියලා ඇහුවාම yes යැයි පැවසූ බවත් 3.30ට පමණ තමා නිවසේ සිට පන්ති කරන බවත් තම දියණිය මුව ආවරණයක් (face mask) පැළඳ පන්ති පැවැත්වෙන ස්ථානයට පැමිණි විට, පන්තියට පැමිණි ළමයින් නංගි ඉකි ගසමින් ඇඬූ බවත් ඇයි නංගි අඬන්නේ යැයි විමසූ විට ටීච ගැහුවා කියලා පැවසූ බව බවත් එසේම නංගි අඬමින් එහෙට මෙහෙට දිව්වා යැයි පවසන ලද බැවින් තමා පන්තිය අවසන් කර දියණියගෙන් පාසලේදී මොකද වුණේ කියලා ඇහුවිට මුලින් දරුවා මුකුත් කිව්වේ නැති බවත් පසුව “මට boy කෙනෙක් ගැහුවා ඒකට ටීච මට ගැහුවා” කියලා පැවසූ බවත් ඉන්පසු තමා කොතනටද ගැහුවේ යැයි ඇසූ විට වම් කම්මුල පෙන්නූ බවත් එවිට තමා මුව ආවරණයක් (face mask) ගලවලා බැලූ බවත් ඒ වනවිටත් මූණේ රතු පාටට යාන්තමින් ඇඟිලි පාරක් දුටු බවත් එය දුටු විට තමාට ඇඬුණු බවත් ස්වාමිපුරුෂයා දුරකථනයෙන් දැනුම් දුන්නාම දඬුවමකට පාරක් ගහන්න ඇති කියලා පැවසූ බවත් දරුවාට බෙහෙත් අරන් දීමක් ගැන ඒ අවස්ථාවේදී හිතුවේ නැති බවත් දරුවාට එම අවස්ථාවේදීම පැනඩෝල් භාගයක් දුන් බවත් එම සිදුවීම සම්බන්ධයෙන් නැවත තමා දරුවාගෙන් විමසීමක් සිදු නොකරන ලද බවත් ප්‍රකාශ කර ඇත. ඉන්පසු දරුවාට රාත්‍රියේ කෑම දීලා නිදි කරන ලද බවත් පසුව එකපාරටම දරුවා කෑ ගහන්න ගත් බවත් එවිට මොකද වුණේ කියලා ඇහුවම so paining කියමින් ඇඬූ බවත් පසුව තමා දරුවා ආයේ නිදි කරන ලද බවත් එහෙත් ටිකකින් ආපහු ඒ විදිහටම  දරුවා අඬන්න ගත් බැවින් නැවත පැනඩෝල් ලබා දුන්නද දරුවාට නින්ද නොගිය බවත් දරුවාට පහර දුන් පැත්තට හිස හැරුණු විට දරුවා කෑ ගහලා අඬන බව නිරීක්ෂණය වූ බවත් තමා පසුදින දරුවා පාසලට රැගෙන ගිය බවත් පාසල අවට සිටි දරුවන්ගේ අම්මලා දෙන්නෙකුටත් දරුවාව පෙන්නූ බවත් ප්‍රාථමික ශ්‍රේණිය භාර සේපාලිකා ගුරුතුමිය පාසලට පැමිණි විට එම ගුරුතුමියට දරුවාගේ මූණ පෙන්නූ බවත් එවිට මං ටීචට කියන්නම් ටීච ගහලා නේද කියා පැවසූ බවත් දරුවාට පහර දුන් ගුරුතුමිය පාසලට පැමිණි පසු තමා දරුවාව පන්තියට රැගෙන ගොස් “*මගෙ බබා කාටද ගැහුවේ*” කියලා ඇසූ බවත් එවිට එම ගුරුතුමිය “සැර කරලා *මෙයා ඇවිත් එකක් කිව්වාද? අර අහිංසක සඳකගේ අත හපලා* මෙයාගෙ මකන කෑල්ලක් ගත්තා කියලා. මෙයාගේ දේවල කාටවත් ගන්නෙපා කියලා තියෙන්නේ” යැයි පැවසූ බවත් ඒ අවස්ථාවේදී දරුවා තමාගේ ඇඳුමේ එල්ලිලා Mama this teacher is punishing, I don’t want this teacher කියලා අඬන විට ගුරුතුමිය ළමයාව ඇදගෙන බුදුන් වඳින්න අරන් ගිය බවත් පසුව ළමයා උදේ ආහාර ගන්නා අවස්ථාවේ තමා දරුවාගෙන් Do you coming with me කියලා ඇසූ බවත් පසුව තමා පාසල අවසන් වෙනකම් එළියේ ඉඳලා දරුවාව රෝහල් වෙත රැගෙන ගිය බවත් ඊට පෙර පාසලේ විදුහල්පතිවරයා හමුවීමට ගියද එම අවස්ථාවේ විදුහල්පතිවරයා නොසිටි බවයි. දරුවා මුලින් පානම රෝහලට ඇතුලත් කරන ලද බවත් 2023.05.13 වන දින

දරුවාගේ නාසයෙන් ලේ වහනය වීම හේතුවෙන් දහවල් 12 ට පමණ පොතුවිල් මූලික රෝහලට මාරු කරන ලද බවත් මෙම සිදුවීම හේතුවෙන් දරුවා දැඩි ලෙස මානසිකව පීඩා විඳින අතර මේ වනවිට කළුබෝවිල රෝහලේ ප්‍රතිකාර ගන්නා බවත් දරුවාට සිදු වූ මෙම සිදුවීම හේතුවෙන් තමාද මානසික රෝග සඳහා ප්‍රතිකාර ලබා ගන්නා බවත් ප්‍රකාශ කර ඇත.

**පැමිණිල්ල සනාථ කිරීමට ඉදිරිපත් කර ඇති සාක්ෂි**

1. ඡායාරූප
2. අධිකරණ වෛද්‍ය නිලධාරිගේ වාර්තාවට අනුව

අ. රෝගී ඉතිහාසය ලෙස:

විරාජිනී ගුරුතුමිය කම්මුලට ගැසූ බවත් වෙන කොහෙටවත් ගැහුවේ නැති බවත් කන ටිකක් විතර ඇහෙන්නේ නැති බව

ආ. තුවාල ලෙස :

i. A contusion measuring 5 cm * cm over left cheek (වම් කම්මුලෙහි සෙන්ටි මීටර් 5 ක තැල්මක්)

ii. Traumatic central perforation of left tympanic membrane (බාහිර බලයක් වම් කන් බෙරය (කර්ණපටහ පටලය) ඉරීමක්.

ඇ. මතය

i. උක්ත සඳහන් තුවාල බරපතල ඝනයේ එවා නොවන බවත්,

ii. The examiner gives history of blunt force trauma following an assault and it's compatible with given history central perforation was completely healed' (මොට බලයකින් වූ කම්පනයක් මත වූ තුවාල බවත් රෝගී ඉතිහාසයේ සඳහන් කරුණු අනුව සැසඳෙන බවත් කන් බෙරය (කර්ණපටහ පටලය) සිදුරුවීම සම්පූර්ණයෙන් සුව වී ඇති බවත්ය

**වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම**

**1 වන වගඋත්තරකාර කේ.විජේරාණි මහත්මියගේ කරුණු දැක්වීම**

මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ අම්පාර ප්‍රාදේශීය කාර්යාලයේ 2023.06.27 දින පරීක්ෂණයක් පවත්වා ඇති අතර කොළඹ ප්‍රධාන කාර්යාලයේද 2024.11.26 දින පරීක්ෂණයක් පවත්වා ඇත. එකී පරීක්ෂණයන්ට සහභාගි වෙමින් පැමිණිල්ල සම්බන්ධයෙන් වටහිර, පානම පදිංචි කිරුපරාජා විජේරාණි ගුරුමහත්මිය ප්‍රකාශ කර සිටින්නේ, තමා ප්‍රාථමික ගුරුවරියක ලෙස මුල් පත්වීම පානම සිංහල මහා විද්‍යාලයට ලද බවත් මෙවන විට වසර 35 ක් පමණ සේවා කාලයක් සම්පූර්ණ කර ඇති බවත් තම සේවා කාලය තුල 1 – 5 වසර

දක්වා ඉගැන්වීම කටයුතු සිදු කරන ලද බවත් ඒ සඳහා ප්‍රාථමික ගුරු පුහුණුවක් ලබා ඇති අතර එහිදී ළමුන්ට විෂය ඉගැන්වීම හා දරුවන් සමඟ ක්‍රියා කරන ආකාරය සම්බන්ධයෙන් පුහුණු වීම් ලබා ඇති බවත් තමා 2023.04.19 වන දින ස්ථාන මාරු ලබා අම්/ පානම විද්‍යාලයට පැමිණි බවත් ඒ වන විට පුරප්පාඩු 1බී පන්තියේ පැවැති බැවින් එම පන්තියේ වැඩභාර ගත් බව සඳහන් කර ඇත. 2023.05.10 වන දින උදේ පාසල් ගොස් ඉගැන්වීම් කර දවල් විවේක කාලයේදී ළමයි එළියට ගොස් ආපසු පන්තියට පැමිණි විට තමා "අපේ ගෙදර" පරිසර පාඩම කියලා දීලා ළමුන්ට පරිසර පොත් සහ පාට පැන්සල් පෙට්ටියි බෙදලා දිලා තමන්ගේ ගෙදර ඉන්න අය චිත්‍රයට නඟන්න උපදෙස් දි ගුරු මේසයේ වාඩි වී සිංහල පැවරුම් ලකුණු කරන ලද බවත් ටික වේලාවකින් පන්තිය ඇතුළෙන් අඬන සද්දයක් ඇහුණ බැවින් ඒ පැත්තට යන විට ක්‍රිස්ටිනා කියන ගැහුණු ළමයා සඳක කියන පිරිමි ළමයගේ අත හපාගෙන ඉන්නවා දැක්ක බවත් ඉන්පසු තමා 'ක්‍රිස්ටිනා... ක්‍රිස්ටිනා' කියා දෙපාරක් කතා කරන ලද බවත් අතහරින්න කියූ විට අත හැරියේ නැති බැවින් ඉන්පසු තමාගේ දකුණු අතින් ක්‍රිස්ටිනාගේ වම් කට පැත්තට අතින් තට්ටුවක් දැමූ බවත් එය සඳක කියන පිරිමි ළමයාගේ අත බේරා ගැනීම සඳහා සිදු කරන ලද ක්‍රියාවක් බවත් එවිට ක්‍රිස්ටිනා කට අරින ලද බවත් සඳකගේ අතේ දත් පහරවල් වැදිලා සහ කෙළ වලින් නැහැවිලා තිබූ බවත් ප්‍රකාශ කර ඇත. තමා 'ඇයි හැපුවේ' යැයි ක්‍රිස්ටිනාගෙන් විමසූ විට කිසිවක් ප්‍රකාශ කල නැති බවත් සඳක විසින් ඔහුගේ ඇඟිල්ලෙන් අත් ලේන්සුවක් පෙන්නා ඇඩූ බවත් එම ලේන්සුව ක්‍රිස්ටිනාගේ බවත් එම ලේන්සුව ගන්න ගිය විට අත හැපූ බව සඳක විසින් පැවසූ බවත් පසුව තමා ක්‍රිස්ටිනාගේ දේවල් අනික් අය ගන්නවට අකමැති නිසා එයාගේ බඩු ආයේ කවුරුත් ගන්න එපා ලෙසින් පැවසූ බවත් එසේම "එහෙම ළමයි හපන්න හොඳ නෑ. සත්තුනේ හපන්නේ" ලෙසින් ක්‍රිස්ටිනාටත් කියලා දෙන්නටම අවවාද දීල ගුරු පුටුවේ වාඩි වුණ බවත් පසුව දීපු චිත්‍ර ඇඳලා අවසන් වුණ ළමයි තමාට චිත්‍ර පෙන්නූ බවත් ක්‍රිස්ටිනාත් එයා ඇඳපු චිත්‍රය පෙන්න ආ බවත් ඇය ඇඳලා තිබ්බේ අම්මයි, ක්‍රිස්ටිනායි විතරක් බැවින් තාත්තා චිත්‍රයට නොඇන්ද හේතුව විමසූ විට තාත්තා කොළඹ යැයි පැවසූ බවත් එවිට තමා ඒකට කමක් නෑ එයාවත් ඇඳගෙන එන්න කියලා පැවසූ බවත් ඉන්පසු පාසල අවසන් වූ බැවින් දරුවන් සමඟ සුපුරුදු පරිදි ගේට්ටුව අසලට ගිය බවත් ක්‍රිස්ටිනාත් ත්‍රීවිල් රථයකින් ගෙදර ගිය බවත් අනිත් ළමුනුත් පාසලෙන් පිටත් වූ බැවින් තමා පන්තියට පැමිණි පාසල අවසන් වූ පසු ගෙදර ගිය බවත් ප්‍රකාශ කර ඇත. පසුදින එනම් 2023.05.11 දින උදේ 7.15 ට පමණ තමා පාසලට පැමිණ පන්තියට යනවිට පන්තියේ එදින අතුගෑමට නියමිත දරුවන්ගේ අම්මලා, ආහාර රැගෙන එන අම්මලා සමඟ ක්‍රිස්ටිනාගේ අම්මත් හිටිය බවත් තමා පොත් ටික අස්කරලා ඉන්න කොට උදේ බුදුන් වඳින්න සීනුව නාද වූ බැවින් බුදුන් වඳින්න යන්න පේළියට එන්න කියලා ළමුන්ට කියූ බවත් ඒ අනුව ළමුන් සුපුරුදු පරිදි පේළියට බුදුන් වඳින්න සිටි බවත් නමුත් ක්‍රිස්ටිනා එයාගේ අම්මා ළඟම සිටි බවත් ක්‍රිස්ටිනාගේ අම්මා 'දුවව ගෙදර එක්කං යනවා' කියලා පැවසූ විට තමා 'ඇයි' ලෙසින් විමසූ විට 'ඊයේ ටීච දුවට ගහපු නිසා' යැයි ක්‍රිස්ටිනාගේ

අම්මා පැවසූ විට තමා 'දුවගෙන් මම ගහපු හේතුව ඇහුවේ නැද්ද' ලෙසින් පැවසූ විට 'සඳකගේ අත හපපු නිසා ගැහුවා' කියලා ක්‍රිස්ටිනාගේ අම්මා පැවසූ බවත් එවිට තමා 'මං ගහපු එක වැරැද්දක්ද' කියලා ක්‍රිස්ටිනාගේ අම්මාගෙන් විමසූ විට අම්මා මුකුත් කිසිවකු නොකියූ බවත් තමා ක්‍රිස්ටිනාගෙන් බුදුන් වඳින්න යමුද අහන විට ක්‍රිස්ටිනා දුවගෙන ඇවිත් බුදුන් වැන්දලා උදේ ශාරීරික ක්‍රියාකාරකම් සිදු කල පසු පන්තියට පැමිණිලි බවත් පන්තියට ආපසු එනකොට පන්තියේ සිටි අම්මලා උදෑසන කෑම බෙදලා තිබූ බවත් ක්‍රිස්ටිනා එයාගේ පුටුවේ ඉඳගත් බවත් ඇයගේ අම්මත් එතනම හිටි බවත් දරුවා අම්මට මොනවද කියනවා දුටු බැවින් තමා 'මොනවද දුව කියන්නේ' කියලා ඇහුවහම 'අම්මා කිව්වා මෙයා ආපහු කෑම ඉල්ලනවා' කියලා එවිට තමා 'ආපහු දෙන්න' කියලා පැවසූ බවත් එදින ක්‍රිස්ටිනා කෑම කා පන්තියේ සාමාන්‍ය විදිහට වැඩ කරලා පසුව පාසල් අවසන් වූ විට වෙනදා වගේ ම දරුවන්ව ගේට්ටුව ලඟට අරගෙන ගිහින් තමා පසුව පන්තියට ආපසු පැමිණි බවත් ප්‍රකාශ කර ඇත. පසුව සවස 1.25ට පමණ අමිත ගුරුමහතා තමාට විදුහල්පතිවරයා පැමිණෙන ලෙසට දැන්වූ බැවින් විදුහල්පති කාර්යාලයට ගිය බවත් එම අවස්ථාවේ නියෝජ්‍ය විදුහල්පති සහ ගුරු උපදේශක ගාමිණී මහතාත් ද විදුහල්පති කාමරයේ සිටි බවත් ඔවුන් විසින් තමාගෙන් 'ඉන්දිකාගේ දුවට මොනවාහරි වුණාද' ලෙසින් විමසූ විට 'සඳකගේ අත හපා ගෙන හිටිය නිසා කටට තට්ටුවක් දැම්මා' ලෙසින් පැවසූ බවත් එවිට ඉන්දිකා දරුවා සමඟ කාර්යාලයට ඇවිත් 'ටීච මගේ ළමයාට ගහලා තියෙනවා. ඇයි ඇහුවම ළමයෙකුගේ අත හැපුවා කිව්වා. මගේ දරුවත් හොඳයි කියන්නේ නැහැ. මෙයත් හරි දඟයි. ඒ නිසා ටීච ගහන්නැති' ලෙසින් පවසා එම සිද්ධිය කියලා යන්නයි ආ බවත් පවසා ඉන්දිකා ගෙදර ගියා යැයි විදුහල්පති කාමරයේ සිටි අය පැවසූ බවත් ඉන්පසුව තමන්ද ගෙදර ගිය බවත් ප්‍රකාශ කර ඇත. පසුව ක්‍රිස්ටිනා දියණියව රෝහලට ගත කර ඇති බව තමාට නංගි කෙනෙක්ගේ මාර්ගයෙන් ආරංචි වුණා බවත් රෝහලේදී නරක විදිහට ඉන්දිකා තමාට බනිනවා කියලත් ආරංචි වුණ නිසා තමා රෝහලට නොගිහින් ඉන්දිකාට දුරකථන ඇමතුමක් ගත්තත් එයට පිළිතුරු ලබා නොදුන් බවත් පසුව තමාගේ නංගි සහ මල්ලිගේ නෝනා දියණිය බලන්න රෝහලට ගිය බවත් එම අවස්ථාවේ දියණිය හොඳට ඇඳේ සෙල්ලම් කර කර සිටි බවත් රෝහලට ගෙනාවේ 'ඇයි' දැයි විමසූ විට 'ඇහැ රිදෙන නිසා අරන් ආවා' බව පැවසූ බැවින් ඔවුන් දරුවාගේ ඇහැ දිහා බැලූ බවත් එහි වෙනසක් දැක්කේ නැති බව රෝහලය ගිය තම සහෝදරියන් තමාට ප්‍රකාශ කරන ලද බවත් 2023.05.12 වන දින පාසල් ගිය විට විදුහල්පතිතුමිය ප්‍රශ්නයක් වුනාද දැයි විමසූ විට තමා ඔව්.. ක්‍රිස්ටිනා රෝහල් ගත කර ඇති බවත් ඇයගේ අම්මා තමාට නරක විදිහට බැනලා තියෙන නිසා තමා රෝහලට නොගිය බවත් විදුහල්පතිතුමියට පැවසූ විට විදුහල්පතිතුමිය දියණිය බලන්න රෝහල යන්නම් යැයි පැවසූ බවත් එදින ප.ව. 12 – 12.30 ට විතර පාසලට පොලිසියෙන් පැමිණ එම සිද්ධිය සම්බන්ධයෙන් කටඋත්තරයක් ලබා දීමට සවස 2.30 – 3.00 ට පමණ පොලිසියට පැමිණෙන ලෙසට දැනුවත් කරන ලද බැවින් තමා පොලිසියට ගිය බවත් 2023.05.15 වන දින තම මවට බෙහෙත් ගැනීමට

නුවර ප්‍රදේශයට ගිය බවත් 2023.05.17 වන දින නංගි දුරකථන ඇමතුමක් ලබා දෙමින් උප පොලිස් පරීක්ෂක කෙනෙක් තමාව හොයන් ගෙදර එන බැවින් ඉක්මනට ගෙදර එන ලෙස දැන්වූ බැවින් තමා 2023.05.18 වන දින නීතිඥවරියක සමඟ පොලිසියට ගිය බවත් ඉන්පසු අධිකරණයට ඉදිරිපත් කර 2023.05.24 වන දින තෙක් රක්ෂිත බන්ධනාගාර ගත කොට ඇප ලබා දුන් බවත් ප්‍රකාශ කර ඇත.

පැමිණිල්ල පිළිබඳව තවදුරටත් කියා සිටින්නේ මේ දරුවාට කුඩා කල සිට කනේ අමාරුවක් තිබූ බවත් ඒ පිළිබඳ සාක්ෂි තමා සතුව ඇති බවත් ඒවා කොමිෂන් සභාවට රහස්‍ය ලේඛන ලෙස ඉදිරිපත් කළ හැකි බවත් එසේම දරුවා එදින සතුටින් පාසල් ඇරී ගිය බවට සහ පසුවදා පැමිණි බවට ද සාක්ෂි පවතින බවත් මේ සිද්ධිය සම්බන්ධයෙන් පොලිසිය අපක්ෂපාතීව කටයුතු නොකරන බවත්, ඒ සඳහා බලපෑම් කරන බව පෙනී යන බවත් එසේම පානම කියන්නේ ඉතා කුඩා වපසරියක් තියෙන ගමක් බවත් විනාඩි 30ක් ඇතුළත වාහනයකින් යන්න පුළුවන් ගමක් බවත් ඒ ගමේ මිනිස්සුත් උදව් කරන අය බැවින් ළමයෙක් රෝහල් ගත කළ යුතු බව දැනුම් දුන්නේ නම් මුදල් නොමැති වුවත් රෝහල් ගත කරන බවට තමා විශ්වාස කරන බවත්, එසේම දරුවාගේ නිවසේ සිට එම රෝහලට තියෙන දුරට වඩා පාසලට ඇති දුර වැඩි බවත් එතරම් අමාරුවෙන් සිටින ළමයෙක්ව නම් රාත්‍රියේදීම රෝහලට ගත කිරීමට තිබූ බවත් එසේ නොමැති නම් පසු දින උදෑසනද රෝහලට යාමටද අවස්ථාව තිබූ බවත් එහෙත් දරුවා රෝහලට රැගෙන නොගිහින් පාසලට ඇවිත් බවත් දරුවාගේ අම්මා පවසන පරිදි දරුවා බලෙන් පාසලේ රඳවා ගත්ත නම් විදුහල්පති හෝ පොලිසියට පැමිණිල්ලක් කොට දරුවාව ගන්න තිබුණ බවත් ප්‍රකාශ කර ඇත. එසේම දරුවා රෝගාබාධ නොමැතිව දවස් 2ක් පානම රෝහලේ සිටි බවත් දෙවන දවසේ ලේ තියෙන බවට පුළුන් පෙන්වා ඇති නමුත් සලකුණක් තිබී නැති බවත් පසුව මවගේ ඉල්ලීම මත පොතුවිල් රෝහලට ඇතුළත් කර ඇති බවත් එහි කන් පරීක්ෂා කිරීමේ පහසුකම් නැති බැවින් පෙනී යන්නේ ඒ වන විට කනේ ආබාධයක් තිබූ බව තහවුරු කරගෙන නොතිබූ බවත් එසේම රෝහලට ඇතුළත් කල දිනට පසුවදා රාත්‍රියේ දරුවගේ අම්මා කනෙන් ලේ පැමිණ ඇති බව වෛද්‍යවරයාට දන්වා ඇති බවත් පසුව කන පරීක්ෂා කිරීමට අම්පාරට හා මඩකලපුවට යොමු කර ඇති බවත් ඒ අනුව ඉහත කරුණු සමඟ තමා දරුවාගේ කනට සුළු පහරදීමක් පමණක් සිදු කළ බවත්, ඒ තුළින් මෙතරම් දරුණු සිදුවීමක් විය නොහැකි බවත් මේ සම්බන්ධයෙන් අධිකරණයේ නඩුවක් පවතින අවස්ථාවේ එකී නඩුවේ තීන්දුවෙන් වරදකරු වීමට පෙර තමාව වරදකාරයෙකු කර සමාජ මාධ්‍යවල ප්‍රචාරය කර ඇති බවත් වැඩිදුරටත් කරුණු දක්වා ඇත. ප්‍රාථමික ගුරු පුහුණු වලදී ලබා ඇති පුහුණු අනුව දරුවන් දෙදෙනෙකු රණ්ඩුවන අවස්ථාවක කටයුතු කළ යුතු ආකාරය උගන්වා තිබේද සහ ඒ ඉගැන්වීම් අනුව ඔබ විසින් මෙම අවස්ථාවේදී කටයුතු කලේද යන්න සම්බන්ධයෙන් පරීක්ෂණ නිලධාරිනියගේ ප්‍රශ්නයට පිළිතුරු දෙමින් වගඋත්තරකාරිය ප්‍රකාශ කර සිටියේ, පුහුණුවීම් වලදී ඒ සම්බන්ධයෙන් උගන්වා ඇති බවත් මේ අවස්ථාවේදී පුහුණුවීම් වලදී ලැබූ

උපදෙස් අනුව කටයුතු කිරීමට උත්සහ කලද දරුවා ප්‍රතිචාර නොදැක්වූ නිසා අනිත් දරුවාට පීඩාව වැලැක්වීම සඳහා කට පැත්තකට තට්ටුවක් දාන්න සිද්ධ වුණ බවත් ඉන් පසුව තමා දරුවෝ දෙන්නටම හොඳින් කතා කල බවත් එසේම සිදුවීම සිදු වූ පසු දින පාසලට දරුවාගේ මව පැමිණි සිදු වීම පැවසු පසුව ඔබ විසින් දරුවාගේ මුහුණෙහි සලකුණු තිබේද යන්න නිරීක්ෂණය කලාද යන්න පරීක්ෂණ නිලධාරිනියගේ ප්‍රශ්නයට පිළිතුරු දෙමින්, දරුවාගේ මුහුණේ සලකුණක් තිබු බවත් එහෙත් ඒ සලකුණ ගැන තමාට සැකයක් ඇති බවට වගඋත්තරකාරිය ප්‍රකාශ කර ඇති අතර වගඋත්තරකාරිය විසින් අතින් දැමූ තට්ටුව හේතුවෙන් දරුවාට බරපතල හානියක් සිදුවිය හැකි තරම් එකක්ද යන්න සම්බන්ධයෙන් වගඋත්තරකරු ප්‍රකාශ කර සිටියේ, තමා දරුවාගේ කටට පහර දුන් බැවින් එය පිළිගන්න නොහැකි බවත් එසේම මීට පෙර පහරදීම සම්බන්ධයෙන් තමාට චෝදනා එල්ල වී නොමැති බවත් අදාල සිදුවීමෙන් පසු පෙර සේවා ස්ථානවල නිලධාරින් ද තමාට යළි එම පාසල්වලට ආරාධනා කරන ලද බවත් මේ වනවිට තමා වෙනත් පාසලක සේවය කරන බවත් ප්‍රකාශ කර ඇත.

<u>නිරීක්ෂණ</u>

01. අම්පාර පානම මහා විද්‍යාලයේ 1 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන ක්‍රිෂ්ටිනා ශලෝමි දැරියට පාසල් පන්ති කාමරය තුලදී 2023.05.10 දින 1 වන වගඋත්තරකාර විජේරාණි ගුරුතුමිය විසින් පහරදී ඇති බවට පැමිණිල්ල මගින් දක්වා ඇත. වින්දිත දැරියට තුවාල සිදුවීම සම්බන්ධයෙන් වගඋත්තරකාර විජේරාණි ගුරුතිමිය ප්‍රකාශ කර සිටින්නේ, තමා විසින් ගැහුණු ළමයා සඳක කියන පිරිමි ළමයගේ අත හපාගෙන ඉන්නවා දැක්ක බවත් ඉන්පසු තමා 'ක්‍රිස්ටිනා... ක්‍රිස්ටිනා' කියා දෙපාරක් කතා කර සඳකගේ අත මුදාහරින ලෙස පැවසුවද සඳකගේ අත නිදහස් නොකල බැවින් සඳක කියන පිරිමි ළමයාගේ අත බේරා ගැනීමට තමාගේ දකුණු අතින් ක්‍රිස්ටිනාගේ වම් කට පැත්තට අතින් තට්ටුවක් දැමූ බවයි.

02. පැමිණිල්ල විසින් ඉදිරිපත් කර ඇති ඡායාරූප වලට අනුව වින්දිත දැරියගේ වම් කණෙන් ලේ වහනය වීමක් සහ වම් කම්මුලෙන් රත්පැහැ ගැන්වීමක් නිරීක්ෂණය වන අතර මෙම සිදුවීමට පසු දින වින්දිත දැරියගේ මව විසින් දරුවා රෝහල් ගත කර අම්පාර, පොතුවිල් යන රෝහල්වන නේවාසිකව ප්‍රතිකාර ලබාගෙන ඇති බැව් නිරීක්ෂණයවේ.

03. අධිකරණ වෛද්‍ය නිලධාරීගේ වාර්තාවට අනුව වින්දිත දැරියගේ වම් කම්මුලෙහි සෙන්ටි මීටර් 5 ක තැල්මක් සහ බාහිර බලයක් වම් කන් බෙරය (කර්ණපටහ පටලය) ඉරීමක් සිදුවී ඇති බවත් එම තුවාල සිදුවීම මොට බලයකින් වූ කම්පනයක් මත වූ තුවාල බවත් රෝගී ඉතිහාසයේ සදහන් කරුණු අනුව සැසඳෙන බවත් එම තුවාල බරපතල සනයේ තුවාල නොවන බවත් නිරීක්ෂණයවේ.

04. පැමිණිල්ලේ අගතියටපත් පාර්ශවය වන ක්‍රිස්ටිනා දියණියට වගඋත්තරකරු වන විජේරාණි මිය විසින් පහරදීමක් සිදු නොකළ බව සනාථ කිරීම සඳහා එකී වගඋත්තරකරු විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභව වෙත 2024.12.20 දිනැතිව දිවුරුම් ප්‍රකාශය කිහිපයක් රහස්‍ය ලේඛන වශයෙන් යොමුකර ඇත. එකී දිවුරුම් ප්‍රකාශ දෙස අවධානය යොමු කිරීමේදී එහි අගතියටපත් පාර්ශවය වන ක්‍රිස්ටිනා දියණියට මෙම සිදුවීම සිදුවීමට පෙර (2023.05.10 පෙර) සිටම කනේ ආබාධයක් පැවති බවට වින්දිත දියණියගේ මව දිවුරුම් ප්‍රකාශකට පැවසූ බව ද එසේම වින්දිත දියණියට එක් කණක ආබාධයක් පෙර පාසලේ ඉගෙන ගන්නා කාලසීමාවේදීද නිරීක්ෂණය කරන ලද බවට වූ කරුණු ඉදිරිපත් කිරීමක් සිදු කර ඇත. එහෙත් එය සනාථ කිරීම සඳහා පිළිගත හැකි වෛද්‍ය වාර්තා කිසිවක් එකී රහස්‍ය ලේඛණ වල ඉදිරිපත් කර නොමැත. එබැවින් වගඋත්තරකාර පාර්ශවය විසින් මෙකී පහරදීම සිදුනොකළ බව දැක්වීම සඳහා ඉදිරිපත් කරන ලද ඉහත විත්තිවාචක හුදු ප්‍රකාශයන් බැවින් සහ එය එකී දිවුරුම් ප්‍රකාශකයන්ගේ පෞද්ගලික දැනුම හෝ අවබෝධය මත ප්‍රකාශ කරන්නක් නොව, වින්දිත දැරියගේ මවගෙන් දැන ගැනීමට ලැබුණු එකක් ලෙස ප්‍රකාශ කරන නිසාත්, මව එම කරුණ ප්‍රතික්ෂේප කරන නිසාද ඒ අනුව එය ප්‍රවාදක සාක්ෂියක් වන බැවින් ඒවායේ සාක්ෂිමය හැකියාවක් නොමැති බවත් එම ප්‍රකාශ වෛද්‍යමය කරුණු තුළින් තහවුරු කර නොමැති බැවින් කොමිෂන් සභාව විසින් එය බැහැර කරනු ලබයි. අගතියටපත් පාර්ශවය වන ක්‍රිස්ටිනා දියණිය පරික්ෂා කරන ලද අධිකරණ වෛද්‍යවරයාගේ 2023.05.17 දිනැති අධිකරණ වෛද්‍ය වාර්තාව තුළින්, දරුවා විසින් රෝග ඉතිහාසයට ලබාදෙන ලද කරුණු අනුව මෙම තුවාලය මොට බලයකින් වූ කම්පනයක් මත වූ තුවාලක් වන බවත්, දරුවා ලබාදී ඇති රෝග ඉතිහාසය හා සැසදෙන බවත් දක්වා ඇත. අදාළ පහරදීම මගින් වින්දිත දියණියගේ වම් කන් බෙරය (කර්ණපටහ පටලය) බාහිර බලයක් හේතුවෙන් ඉරීමක් සිදුව ඇති බවද අධිකරණ වෛද්‍යවරයා සඳහන් කර තිබීමද කොමිෂන් සභාවේ අවධානයට ගනී. ඒ අනුව වගඋත්තරකරුවන විජේරාණි මිය විසින් අගතියටපත් පාර්ශවය වන ක්‍රිස්ටිනා දියණියට තදබල ලෙස පහරදී ඇති බව තහවුරු වේ.

05. එසේම වින්දිත දැරියට පහරදීම සම්බන්ධව දැරියගේ මව විසින් පාසලේ විදුහල්පතිවරියට කරන ලද පැමිණිල්ල සම්බන්ධව එවකට විදුහල්පතිවරයා ලෙස කටයුතු කරන ලද එච්. අශෝකා නන්දනී මහත්මිය විසින් 2023.05.12 හා 23/123 දරණ ලොග් සටහන් පොතේ "අද දින විජයරාණි ගුරුතුමිය ළමයකු හට දඩුවමක් සඳහා ගැසූපාර වැදීම නිසා පොලිසියට ද දන්වා තිබූ බැවින් එය නිරාකරණය කර අත්සන් කර අවසන් කරන ලදී" ලෙසින් ලොග් සටහනක් යොදා ඇති බව අම්/ පානම මහා විද්‍යාලයේ විදුහල්පති ජේ. එස්. ඩී. එම්. ජයවර්ධන මහතා විසින් කොමිෂන් සභාවට යොමු කරන ලද 2025.01.02 දිනැති ලිපිය මගින් නිරීක්ෂණය වේ.

06. ඒ අනුව, වින්දිත දැරියට 2 වන වගඋත්තරකරුවන විදුහල්පති එච්. අශෝකා නන්දනී මහත්මිය විසින් පහර දීම හා සම්බන්ධයක් නොමැති බවට පැමිණිලි විමර්ශනයේදී අනාවරණය වී ඇති අතර අධික්ෂණ නිලධාරියා වශයෙන් මෙම සිදුවීම සම්බන්ධයෙන් ප්‍රකාශයක් ලබා ගැනීමට 2024.11.26 දින කොමිෂන් සභාව වෙත කැඳවා ඇත. එහෙත් ඒ වනවිටත් විදුහල්පති එච්. අශෝකා නන්දනී මහත්මිය විශ්‍රාම ගොස් සිට ඇති බව එදින පරීක්ෂණය සඳහා පැමිණි නිලධාරීන් විසින් කොමිෂන් සභාව වෙත දැනුම් දෙන ලදී.

07. මෙම වින්දිත දැරියගේ මව විසින් පානම පොලිස් ස්ථානයට මෙම සිදුවීම සම්බන්ධයෙන් පැමිණිලි කිරීම මත, පොලිසිය විසින් පොතුවිල් මහේස්ත්‍රාත් උසාවියේ අංක බී 9667/පීසී/23 යටතේ නඩු වගඋත්තරකාර විජේරාණි ගුරුතුමියට එරෙහිව පවරා ඇති බවත් දැනට එම නඩුව පිළිබඳව නීතිපතිවරයාගේ උපදෙස් ලබා ගැනීම සඳහා යොමු කර ඇති බවද අනාවරණය වේ.

08. එසේම මොරටුව වේල්ස් කුමරි විදුහලේ විදුහල්පති විසින් කොමිෂන් සභාවට යොමු කරන ලද 2025.02.19 දිනැති ලිපිය අනුව අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අංක ED/ 1/6/3/21/ AD/2024 සහ 2024.08.29 දිනැති ලිපියේ අනුමැතිය මත ක්‍රිෂ්ට්‍රිනා ශලෝම් දියණිය ඇතුළත් වීමේ අංක 24650 යටතේ 2025.01.10 වන දින මොරටුව වේල්ස් කුමරි විද්‍යාලයේ දෙවන ශ්‍රේණියට ඇතුලත් කර ගෙන ඇති බවද නිරීක්ෂණය වේ.

09. එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය (UNCRC) 1989 නොවැම්බර් 20 වන දින ප්‍රකාශයට පත්කර ඇත. ශ්‍රී ලංකාව 1990 ජනවාරි 26 වන දින ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට අත්සන් තැබූ අතර 1991 ජූලි 12 වන දින එය අපරානුමත කර ඇත. ඒ අනුව ශ්‍රී ලංකාව විසින් 1992 දී ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය සකස් කරනු ලැබ ඇත. එසේම, ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියට අත්සන් තබා ඇති බැඳීම්වලට අනුකූලව, ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ අරමුණ තවදුරටත් වර්ධනය කිරීම සඳහා බහුවිධ සම්මුතීන් අත්සන් කර අපරානුමත කිරීමට මෙන්ම ඒ සඳහා ජාතික නීති ක්‍රියාත්මක කිරීමට සහ සංශෝධනය කිරීමට කටයුතු කර ඇත.

10. පාසල් පරිසරය තුල විනය නිසි ලෙස පවත්වා ගැනීම පිණිස අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2016.04.29 දිනැති චක්‍ර ලේඛ අංක12/2016 නිකුත් කර ඇත. එමඟින් පාසලක විනය ආරක්ෂා කර ගැනීමේ වැදගත්කම මැනවින් පහදා දී ශාරීරික දඬුවම් තහනම් කර ඇති අතර ඒ වෙනුවට ගතයුතු ක්‍රියා මාර්ග සැබැඳිව කරුණු විග්‍රහ කර ඇත. එවැනි දඬුවම් පැමිණවීම හේතුකොටගෙන නීතිමය ක්‍රියාමාර්ගයන්ට මෙන්ම විනය ක්‍රියාමාර්ගයන්ට මුහුණ දීමට සිදුවන බවද දක්වා ඇත. ළමයින් සම්බන්ධව මෙම කරුණ තවදුරටත් තහවුරු කරමින් 12/2016 චක්‍ර ලේඛනයේ සඳහන් උපදෙස්වලට අමතරව ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක FR 461/2012

තීන්දුවෙන් ලබාදුන් උපදෙස් අනුව 2026.03.30 වන දිනැතිව නිකුත් කර ඇති චක්‍රලේඛ අංක 11/2026 හි සඳහන් විධිවිධාන මඟින්ද එම කරුණු අවධාරණය කර ඇත. එමඟින්ද "කිසිදු දරුවෙකුට දඬුවම් කිරීමේ ක්‍රමයක් ලෙස හෝ වෙනත් හේතුවක් නිසා හෝ කිසිදු ශාරීරික හෝ මානසික හෝ හානියක් සිදු නොකළ යුතු ය. කිසිදු ආකාරයක ශාරීරික දඬුවමක් කවර මට්ටමකින්වත් සිදු කළ නොහැකි අතර, වැරදිකරුවන්ට නීතිය අනුව කටයුතු කරනු ලැබේ." ලෙසින් ද, සිසුන් සමඟ කටයුතු කිරීමේදී සිසුන්ගේ ධනාත්මක හැසිරීම් උදෙසා මැදිහත් වීම සහ සහාය ලබා දීම ආදී ක්‍රම අනුගමනය කළ යුතු බවද එමඟින් තවදුරටත් පෙන්වා දී ඇත.

11. මේ හා සමානවම ඉසව්ගත කරුණු හා බැඳුනු ඉතා මෑත කාලීන නඩු තීන්දුවක් වූ ***Hewa Maddumage Karunapala and Others vs. Jayantha Prema Kumara Siriwardhana and Others*** *(SC/FR/97/2017)* නඩුව සඳහා 2021.02.12 වන දින විනිසුරු තුරෙයිරාජා මැතිතුමා පෙන්වා දුන්නේ, "As educators, teachers hold a primary responsibility in ensuring the safety of children. As discussed above, it has been expressly clarified by the Ministry of Education that Corporal Punishment is against this fundamental responsibility. Additionally, it is the practices ingrained and experienced by children that they carry forward into adulthood. Experiencing physical violence in childhood increases the likelihood of producing adults that engage in violence in daily life" එනම් අධ්‍යාපනඥයින් ලෙස, ගුරුවරුන් දරුවන්ගේ ආරක්ෂාව සහතික කිරීමේ මූලික වගකීමක් දරණ බවත් ඉහත සාකච්ඡා කළ පරිදි, අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ප්‍රකාශිතවම පැහැදිලි කර ඇත්තේ ශාරීරික දඬුවම් මෙම මූලික වගකීමට පටහැනි බවයි. ඊට අමතරව, දරුවන් වැඩිහිටි වියට පත්වන විට ඔවුන් තුළ මුල් බැසගත් සහ අත්විඳින ලද භාවිතයන් ඔවුන් ඉදිරියට ගෙනයයි. ළමා වියේදී ශාරීරික හිංසනය අත්විඳීම, එදිනෙදා ජීවිතයේදී ප්‍රචණ්ඩත්වයේ යෙදෙන වැඩිහිටියන් බිහි කිරීමේ සම්භාවිතාව වැඩි කරයි යනුවෙනි.

12. In the case of ***Bandara v. Wickremasinghe*** *(1995) 2 SLR 167* in which the Petitioner, a school student had been assaulted during school hours by the Deputy Principal, Vice Principal and a teacher, Kulatunga J. observed that "the discipline of students was a matter within the purview of school teachers and that whenever they act with the objective of maintaining discipline, they act under the colour of office. Therefore, if in doing so, they exceed their power, they may become liable for the infringement of fundamental rights by executive and administrative action. මෙම නඩුවේ පෙත්සම්කරු, පාසල් සිසුවෙකුවූ අතර නියෝජ්‍ය විදුහල්පති, උප විදුහල්පති සහ ගුරුවරයෙකු විසින් පාසල් වේලාවන් තුළ පහර දී ඇති බව සඳහන් කරමින් පෙත්සම ඉදිරිපත්

කර තිබුණි. මෙම නඩුවේදී කුලතුංග විනිසුරුවරයා නිරීක්ෂණය කළේ, “සිසුන්ගේ විනය පාසල් ගුරුවරුන්ගේ විෂය පථයට අයත් කාරණයක් බවත්, ඔවුන් විනය පවත්වා ගැනීමේ අරමුණින් ක්‍රියා කරන සෑම විටම ඔවුන්ගේ තනතුරෙන් අවසරලත් නිල කාර්යක් බව පෙනී ගියද කෙසේවෙතත් එකී බලය අතික්‍රමණය කරමින් ක්‍රියා කිරීම මඟින් විධායක හා පරිපාලන ක්‍රියා මගින් වන මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම සඳහා ඔවුන් වගකීමට යටත් වන බවයි”.

13. තවද මෙම පැමිණිල්ලේ වින්දිත දැරිය මෙම සමස්ථ සිදුවීම හමුවේ මානසික කම්පනයකට පත්වීම හේතුවෙන් ඒ සඳහා ප්‍රතිකාර සඳහා යොමුව ඇති බවද පැමිණිලි පාර්ශවය විසින් ඉදිරිපත් කර ඇති ලේඛන පරීක්ෂා කිරීමේදී පැහැදිලි වේ.

14. in the case of ***W.M.K. de Silva v. Chairman, Ceylon Fertilizer Corporation*** *[1989] 2 S.L.R. 393* it was recognized that Article 11 of the Constitution is not confined to physical violence and encompasses protection against emotional or psychological harm as well. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව ශාරීරික හිංසනයට පමණක් සීමා නොවන බවත් භාවාත්මක හෝ මානසික හානිවලින් ආරක්ෂාව ද ඇතුළත් වන බවත් හඳුනා ගන්නා ලදී.

15. it was observed in the case of ***Wijesinghe Chulangani vs. Waruni Bogahawatte*** *SC FR App No. 677/2012* (Supreme Court minutes; 12th June 2019) that while it is established law that in addition to a high degree of certainty, that a very high degree of maltreatment is also required to make a finding on cruel, inhumane, degrading treatment under Article 11, “ what amounts to a ‘high degree of maltreatment’ in relation to an adult does not always resonate with the mental constitution of a minor. Therefore, when a minor complains of degrading treatment, the Court as the upper guardian must not be quick to dismiss the claims for failing to meet the same high threshold of maltreatment. Instead, it must carefully consider the impact the alleged treatment may have had on the mentality and the growth of the child.” 11 වන ව්‍යවස්ථාව යටතේ කුරිරු, අමානුෂික, අවමන් සහගත සැලකිලි පිළිබඳ නිගමනයක් කිරීමට ඉහළ මට්ටමේ තහවුරු කිරීමකට අමතරව, ඉහළම මට්ටමේ හිංසනයක් ද අවශ්‍ය බව ස්ථාපිත නීතියක් වුවද, "වැඩිහිටියෙකුට අදාළව 'ඉහළම මට්ටමේ හිංසනයක්' යන්න බාල වයස්කරුවෙකුගේ මානසික මට්ටම සමඟ සැමවිටම සමාන නොවේ. එබැවින්, බාල වයස්කරුවෙකු අවමන් සහගත සැලකිලි ගැන පැමිණිලි කරන විට, ළමයින්ගේ ඉහළ භාරකරු ලෙස අධිකරණය එම ඉහළ මට්ටමේ හිංසන සැලකිලි සපුරාලීමට අපොහොසත් වීමෙන්

පමණක් හිමිකම් ප්‍රතික්ෂේප කිරීමට හදිසි නොවිය යුතුය. ඒ වෙනුවට, කරනු ලබන චෝදනා දරුවාගේ මානසිකත්වයට සහ වර්ධනයට ඇති කළ හැකි බලපෑම ප්‍රවේශමෙන් සලකා බැලිය යුතුය." මෙකී තීරණය අනුවද වින්දිත දැරියට සිදුව ඇති මානසික වදහිංසාව අමානුෂික, අවමන් සහගත සැලකිල්ලක් ලෙස සැලකීමට හැකි බව නිරීක්ෂණය වේ.

<u>නිගමනය</u>

වින්දිත දියණිය 1 වන ශ්‍රේණියේ අධ්‍යාපනය ලබන අවුරුදු 6 ක් වන කුඩා දරුවෙක් බැවින් ඇය පන්ති කාමරයේ වෙනත් දරුවෙකුගේ අත සපා කෑම හේතුවෙන් වගඋත්තරකාර ගුරුතුමිය විසින් එකී දරුවා බේරා ගැනීමෙ අදහසින් වින්දිත දැරියගේ කටට පහරක් ගැසූ බව ප්‍රකාශ කළ ද එකී පහරදීම හේතුවෙන් වින්දික දැරියගේ කණට සිදුවී ඇති හානිය සම්බන්ධයෙන් ඉදිරිපත් වී ඇති වෛද්‍ය වාර්තා කෙරෙහි අවධානය යොමු කිරීමේදී එකී පහරදීම තවත් දරුවකු බේරා ගැනීම සඳහා සිදු කරන ලද දඩුවමක් ලෙස සමපාත කිරීමට නොහැකි බවත් එය ඉන් ඔබ්බට ගියා වූ වද හිංසාවක් හෝ අමානුෂික හෝ අවමන් සහගත සැළකිල්ලක් ලෙසට පෙනී යයි.

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාව ප්‍රකාරව "කිසිම තැනැත්තකු වද හිංසාවට හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැළකිල්ලට නැතහොත් දඩුවමකට යටත් නොකළ යුත්තේය." යන්න අනුල්ලංඝනීය අයිතිවාසිකමක් වශයෙන් සහතික කොට ඇත. <u>*අමල් සුදත් සිල්වා එ. කොඩිතුවක්කු*</u> නඩුවේදී අතුකෝරල විනිසුරුතුමා සඳහන් කර ඇත්තේ, "අපගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වැනි ව්‍යවස්ථාවට අනුව කිසිවකුත් කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්කට හෝ දඩුවමකට යටත් නොවිය යුතු බවට විධානය කරනු ලබයි. එමඟින් සෑම පුද්ගලයකුටම වෙනකෙනෙකු විසින් කුරිරු හෝ අමානුෂික ලෙස වධහිංසා පැමිණවීම තහනම් කෙරේ. මෙම රටෙහි සෑම පුද්ගලයකුම, ඔහු අපරාධකරුවකු වුවත් හෝ නොවුවත් මෙම අයිතිය පූර්ණ ලෙස සහතික කර ඇති ආකාරයටම හිමිකම ඇත්තේය".

එසේම පාසල් පද්ධතිය තුළ ශාරීරික දඩුවම් පැමිණ වීම නොකළ යුතු අතර ඒ සඳහා ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 12/2016 සහ 11/2026 චක්‍ර ලේඛ මඟින් ප්‍රතිපාදන සලසා ඇත. එසේම ඔවුනගේ හැසිරීම උචිත නොවුවද උක්ත අධිකරණ තීරණයේ සඳහන් පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වැනි ව්‍යවස්ථාව යටතේ තහවුරු කොට ඇති වදහිංසාවෙන් අත්මිදීමේ අයිතිය පාසල් යන පසුවන වයසේ ළමුන් කෙරෙහිද සුරක්ෂිත කොට ඇත්තේය.

ඒ සියළු කරුණු කෙරෙහි අවධානය යොමු කිරීමේදී වගඋත්තරකාරිය විසින් වින්දිත ක්‍රිෂ්ට්‍රිනා ශලෝමි දියණිය සම්බන්ධව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව උල්ලංඝනය කර ඇති බව නිගමනය කරනු ලැබේ. ඒ අනුව මේ සම්බන්ධයෙන් පොතුවිල් මහේස්ත්‍රාත් උසාවියේ අංක බී 9667/පීසී/23 යටතේ වගඋත්තරකාර විජේරාණි ගුරු මහත්මියට එරෙහිව පවරා නඩුව

නීතිපතිවරයාගේ උපදෙස් ලබා ගැනීම සඳහා යොමු කර ඇති අතර වගඋත්තරකාරියට එරෙහිව දණ්ඩ නීති සංග්‍රහයේ කුමන වගන්තිය යටතේ නඩු පැවරිය යුතුද යන්න නීතිපතිවරයා විසින් තීරණය කළ යුතු කරුණක් බැවින් එකී උපදෙස් අනුව ඉදිරි කටයුතු සිදු කලයුතු බවද නිගමනය කරනු ලැබේ.

**ඒ අනුව පහත නිර්දේශයන් ඉදිරිපත් කර සිටී ;**

1. මෙම සිදුවීම සිදුවන විට වින්දිත දැරියට වයස අවුරුදු 06 ක් පමණ වූ අතර මේවනවිටත් දැරිය වයස අවුරුදු 09 ක පමණ කුඩා දරුවෙක් වන බැවින් පළමුවන වගඋත්තරකාරිය විසින් වින්දිත දැරියගේ පියා වන පැමිණිලිකරු වෙත රු. 10,000/- මුදලක් ගෙවිය යුතුය.

**<u>ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය විසින්,</u>**

2. වගඋත්තරකාර කේ.විජේරාණි යන ගුරු මහත්මිය සම්බන්ධයෙන් සුදුසු විනයානුකූල පියවර ගැනීමට කටයුතු කළ යුතු අතර, එසේ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳව කොමිෂන් සභාව දැනුවත් කළ යුතු ය.

2026 .....06 .25..... වන දිනට පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එල්.ටී.බී. දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (හිටපු)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

| | | | |
|---|---|---|---|
| පිටපත :- | .1 අමාත්‍යතුමිය<br>අධ්‍යාපන අමාත්‍යාංශය,<br>ඉසුරුපාය, බත්තරමුල්ල. | - | කා.දැ.ගැ.ස. |
| | 2. ලේකම්,<br>අධ්‍යාපන අමාත්‍යාංශය,<br>ඉසුරුපාය, බත්තරමුල්ල | - | ඉහත නිර්දේශය ප්‍රකාරව සුදුසු පියවර ගැනීම සඳහා |

සැ.යු. - අදාල වන්දි මුදල 'මුදල් ඇණවුමක්' මඟින් ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන්න.